# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2016

# தேசிய கல்வி ஆணைக்குழு

## வருடாந்த அறிக்கை

2016

# National Education Commission

## Annual Report

2016

නො.126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - **No.126, Nawala Road, Nugegoda**

| පටුන | | අංකය |
|---|---|---|
| **1.** හැඳින්වීම | | **02** |
| **2.** කාර්යයන් හා කර්තව්‍යයන් | | **04** |
| **3.** කොමිෂන් සභාවේ සංයුතිය | | **05** |
| **4.** ඉලක්ක හා කාර්ය සාධන දර්ශක | | **06** |
| **5.** කාර්ය සාධන සාරාංශය - **2016** | | **07** |
| **6.** අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය | | **14** |
| **7.** ඇමුණුම් | | |
| ඇමුණුම **I** | - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - **2016** | **15** |
| ඇමුණුම **II** | - විසර්ජන ගිණුම - **2016** | **16** |
| ඇමුණුම **III** | - කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු | **17** |
| ඇමුණුම **IV** | - විගණකාධිපති වාර්තාව - **2016** | **18** |
| ඇමුණුම **V** | - ආයතනික ව්‍යුහය | **24** |

## හැඳින්වීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූල වීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මෙහි ප්‍රධාන කාර්යය වේ.

පළමුවන කොමිෂන් සභාව 1991-1996 කාලපරිච්ඡේදය සඳහා පත් කරනු ලැබීය. දෙවන කොමිෂන් සභාව 1996 ඔක්තෝම්බර් 01 වන දින සිට 2001 සැප්තැම්බර් අවසන් වන තෙක් ක්‍රියාත්මක විය. තෙවන කොමිෂන් සභාව 2001 ඔක්තෝම්බර් 01 දින සිට 2004 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. හතරවන කොමිෂන් සභාව 2004 ජූලි 01 සිට 2006 මාර්තු වන තෙක් ක්‍රියාත්මක විය. පස්වන කොමිෂන් සභාව 2006 අප්‍රේල් 10 සිට සිය කටයුතු ආරම්භ කරන ලද අතර එහි නිල කාලය 2011 වර්ෂයේ අප්‍රේල් 09 දිනෙන් අවසන් විය. හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී.

2016 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති වශයෙන් මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා ක්‍රියා කළේය. උප සභාපතිනිය වශයෙන් 2016. 03. 16 දක්වා ආචාර්ය ජයන්ති ගුණසේකර මහත්මිය ද 2016. 06. 17 දින සිට ආචාර්ය සිවාන්දම් සිවසේගරම් මහතා උපසභාපති (ප්‍රතිපත්ති) වශයෙන් ද 2016.11.02 දින සිට මහාචාර්ය ආරියවංශ දිසානායක මහතා උපසභාපති (සැලසුම්) ලෙස ක්‍රියා කරන ලදී. ලේකම් වශයෙන් එච්. එන්. එන්. ගුණසේකර මහත්මිය ක්‍රියා කළේය. මෙම කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත.

**දැක්ම**

ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කෙරෙන්නාවූත් සියළු අභියෝගයන්ට මුහුණ දීම සඳහා යොදා ගත හැකි බව සහ සාධාරණත්වය සහතික කෙරෙන්නාවූත් පරිපූර්ණ අධ්‍යාපනයක් සැමට ලබාදෙන පෘථුල ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරිම.

**මෙහෙවර**

අධ්‍යාපන පද්ධතියේ සියළු අංශ නොකඩවා පවත්වාගෙන යාම සහතික කෙරෙන්නාවූත් ශ්‍රී ලංකාවේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමේ හැකියාව ඇත්තාවූත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සාකච්ජා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## කාර්යයන් හා කර්තව්‍යයන්

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

## කොමිෂන් සභාවේ සංයුතිය

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

කොමිෂන් සභා කාර්යාලය 126, නාවල පාර, නුගේගොඩ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. දැනට කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 29 දෙනෙකුගෙන් සමන්විතය.

## ඉලක්ක හා කාර්ය සාධන දර්ශක

| | ක්‍රියාකාරකම | අරමුණු | කාර්ය සාධන දර්ශක |
|---|---|---|---|
| 01 | සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම. | සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති යෝජනාවලියක් සම්පාදනය කිරීමට දායකවීම. | සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනය (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම. |
| 02 | ඉගෙනුම් සාධන විෂමතා කෙරෙහි බලපාන පළාත් මට්ටමේ සාධක හඳුනා ගැනීමේ අධ්‍යයනය. | සාමාන්‍ය පෙළ ප්‍රතිඵලයන්ගේ පළාත් විෂමතාවයන් සඳහා බලපා ඇති සාධකයන් හඳුනාගැනීම. | නිර්දේශයන් සහිත අවසන් වාර්තාව සැකසීම. |
| 03 | 3 වන වර්ගයේ ඉතා දුෂ්කර පාසල්වල ගුණාත්මක සංවර්ධනය සඳහා උපාය මාර්ග හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය. | 3 වන වර්ගයේ ඉතා දුෂ්කර පාසල්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අදාළ උපාය මාර්ග හඳුනාගැනීම. | නිර්දේශයන් සහිත අවසන් වාර්තාව සකස් කිරීම. |
| 04 | ප්‍රතිපෝෂණ හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම. | ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිපෝෂණ හා අධීක්ෂණ යාන්ත්‍රණය ස්ථාපනය කිරීම. | කමිටු 09 ක් ස්ථාපනය කිරීම.<br><br>සමාලෝචන වාර්තා 02 ක් සකස් කිරීම. |
| 05 | උසස් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සකස් කිරීම සඳහා මුලපිරීම. | උසස් අධ්‍යාපනයට අදාළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා දායකවීම. | පර්යේෂණ වාර්තාව පිළියෙල කිරීම. |
| 06 | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම (2014 සිට අඛණ්ඩව). | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සඳහා දායකත්වය සැපයීම. | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනය (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම. |
| 07 | තාක්ෂණික හා වෘත්තීය පුහුණු පාඨමාලාවල වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය | තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනයන්වල කාර්යයන්ගේ වර්තමාන තත්ත්වය පිළබඳ සමාලෝචනය කිරීම. | නිර්දේශයන් සමග අවසන් වාර්තාව පිළියෙල කිරීම. |
| 08 | කාර්යය මණ්ඩල සංවර්ධන වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම. | මානව සම්පත් සංවර්ධනය කිරීම තුළින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය සාධනය ඉහල නැංවීම. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම. |

## කාර්ය සාධන සාරාංශය - 2016

### හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත නෛතිකව පැවරී ඇති ප්‍රධාන කාර්ය භාරය පහත සඳහන් පරිදි මූලික භූමිකා තුනක් යටතේ දැක්විය හැක.

1. සැලසුම් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් දේශයේ අධ්‍යාපන ප්‍රතිපත්ති විවරණය
2. කාලීන අවශ්‍යතාවයන්ට අනුරූපී වන පරිදි පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා නව්‍යකරණය
3. උක්ත සමාලෝචන, විශ්ලේෂණ, විවරණ, නව්‍යකරණ ආදිය පසුබිම් කොට ගෙන දේශය සඳහා ප්‍රශස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති රාජ්‍ය නායකයා වෙත නිර්දේශ කිරීම.

උක්ත භූමිකාවන් සපුරාලීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුන යටතේ ස්ථාවර කමිටු 3ක් ස්ථාපනය කරනු ලැබ තිබේ.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
2. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
3. තාක්ෂණික හා කාර්මික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

එක් එක් ක්ෂේත්‍රයෙහි විශේෂඥ දැනුමක් ඇති ප්‍රවීණයන්, එකී ක්ෂේත්‍රයෙහි හසල අත්දැකීම් ඇති වෘත්තිකයින් සහ අදාළ ක්ෂේත්‍රයේ විවිධ කුසලතා ප්‍රකට කර ඇති පෞද්ගලික අංශයේ විද්වතුන් ප්‍රමුඛ ප්‍රධාන පාර්ශවකරුවන් 15-20 අතර සංඛ්‍යාවකින් මෙම ස්ථාවර කමිටු තුන සමන්විත වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයින්ගේ ද ඉහත දැක්වූ ස්ථාවර කමිටු සාමාජිකයින්ගේ ද විශේෂඥ දැනුම සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලීන අත්දැකීම් ද භාවිත කරගනිමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2016 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්හි කාර්ය සාධනය පහත සඳහන් පරිදි සාරාංශ ගත කළ හැක.

### 1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය.

සාමාන්‍ය අධ්‍යාපනය යටතේ පහත ව්‍යාපෘති (ක්‍රියාකාරකම්) 2016 වාර්ෂික සැලැස්මට ඇතුලත් කර ඇත.

- සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය.
- ඉගෙනුම් සාධන විෂමතා කෙරෙහි බලපාන පළාත් මට්ටමේ සාධක හඳුනා ගැනීමේ අධ්‍යයනය.
- තුන් වන වර්ගයේ අති දුෂ්කර පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගෙන අදාළ නිර්ණායක සකස් කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

**1.1 සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලබන ඉතා වැදගත් හා වගකීම් සහිත ක්‍රියාකාරකමකි. මෙය 2013 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේ අවසන් වීමට නියමිත වුවද 2015 වර්ෂයේදී සිදුවූ කොමිෂන් සභාවන්හි වෙනස්වීම් හේතුවෙන් එම කාර්යය අවසන් කිරීමට නොහැකි වූ අතර "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා" වාර්තාව 2016 වර්ෂයේ මුල් කාර්තුවේදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි. ඒ අනුව, එම වාර්තාව සිංහල හා දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

මෙම වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීමට කටයුතු යොදා තිබුන ද ඒ සඳහා සුදුසු දිනයක් ලබාගැනීමට නොහැකි වූ බැවින් 2017 වර්ෂය දක්වා එම කාර්යය කල් දැමීමට සිදුවිණි.

**1.2 ඉගෙනුම් සාධන විෂමතා කෙරෙහි බලපාන පළාත් මට්ටමේ සාධක හඳුනා ගැනීමේ අධ්‍යයනය.**

මෙම අධ්‍යායනයෙහි දත්ත රැස් කිරීමේ උපකරණ පරීක්ෂා කිරීම සඳහා නියමු අධ්‍යයනයක් ලෙස හෝමාගම කලාපයේ පාසල් තුනක ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරතව දත්ත රැස් කිරීමේ උපකරණයන්හි සංශෝධනයන් සිදුකරන ලදී. පසුව 2016 දෙවන කාර්තුවේ දී දත්ත රැස් කිරීමේ සමීක්ෂකවරු ලෙස තෝරා ගන්නා ලද ගුරු උපදේශකවරු හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු සඳහා දත්ත රැස් කිරීමේ උපකරණ හඳුන්වා දීමේ හා උපකරණ බෙදාදීමේ වැඩමුළුවක් පැවැත්විණි.

සමීක්ෂකවරුන් විසින් රැස්කරන ලද දත්ත 2016 ඔක්තෝම්බර් මස අවසන් වන විට ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාලය වෙත ලැබුණි. එසේ රැස් කර ගන්නා ලද දත්තයන්හි සිංහල මාධ්‍ය දත්ත විශ්ලේෂණය කිරීම 2016 වර්ෂය අවසන් වන විට සිදු කෙරිණි.

**1.3 තුන් වන වර්ගයේ අති දුෂ්කර පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගෙන අදාළ නිර්ණායක සකස් කිරීම.**

මෙම අධ්‍යයනයේදී දත්ත රැස්කිරීමේ උපකරණ සකස් කර අවසන් කොට තෝරාගත් තුන්වන වර්ගයේ අතිදුෂ්කර පාසල් 389ක් සඳහා ප්‍රශ්නාවලි යැවීම 2016 මුල් කාර්තුවේ අගභාගයේදී සිදු කරන ලදි. එම පිළිතුරු ප්‍රශ්නාවලි 389න් 280ක පමණ නැවත ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාලය වෙත ලැබී ඇත. ඒ අනුව, අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්.ඩලය මේ වන විට එම පිළිතුරු ප්‍රශ්නාවලි විශ්ලේෂණ කාර්යයෙහි නියැලෙමින් සිටී.

**1.4 ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.**

"ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා" වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමට 2016 වර්ෂය තුළදී නොහැකිවූ නිසා, ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂය අවසන් වනවිටත් නොහැකි විය.

## 2. උසස් අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

### 2.1 උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය.

උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව පත්කිරීම පිණිස නිර්දේශිත නාමයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016 දෙවන කාර්තුව මුල් භාගයේදී ඉදිරිපත් කරන ලදුව, කමිටු රැස්වීම් 2ක් පවත්වන ලදී.

එහිදී උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය සම්පාදනය සඳහා විෂය ක්ෂේත්‍ර 8ක් තෝරා ගෙන ඇති අතර එක් එක් විෂය ක්ෂේත්‍රය යටතේ ඊට අදාළ පර්යේෂණ අධ්‍යයනයන් සඳහා යොමු කිරීම පිණිස නිර්ණය විෂයයන් (Terms Of Reference-TORs) කෙටුම්පත් කර විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් හා කථිකාචාර්යවරුන්ගෙන් සමන්විත බාහිර පර්යේෂණ කණ්ඩායම් මගින් පර්යේෂණ අධ්‍යයනයන් සිදු කර ගැනීමට උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තීරණය කරන ලදි.

මෙම අධ්‍යයනය සඳහා ලෝක බැංකු මූල්‍යාධාර ලබා ගැනීම පිණිස එම ආයතනයේ නිලධාරියකු සමග ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා සාකච්ඡා කළ අතර මෙම අධ්‍යයනයට මූල්‍යාධාර ලබා දීමට එහි දී කැමැත්ත පළ කළද අනතුරු ව පවත්නා මූල්‍යමය තත්ත්වය මත එම ඉල්ලීම ඉටු කළ නොහැකි බව ලෝක බැංකුවේ මෙරට නියෝජිතවරයා විසින් දන්වා ඇත. එබැවින්, 2016 වර්ෂයේ දී විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම සිදු කිරීමට නොහැකි විය.

## 3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය පහත පරිදි වේ.

### 3.1 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව පත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශිත නාමයන් මෙම වර්ෂයේ මුල් කාර්තුව අගදී නිර්දේශ වී ඇති අතර එහි පත් කිරීම් 2016 වර්ෂයේ දෙවන කාර්තුව මැද භාගයේදී සිදු කරන ලදී. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම සඳහා බුද්ධිකලම්භන වැඩමුළුවක් 2016 වර්ෂයේ ඔක්තෝම්බර් මස පවත්වන ලදී. වර්ෂය අවසන් වන විට ස්ථාවර කමිටු රැස්වීම් වාර 2ක් පවත්වන ලදී.

### 3.2 තාක්ෂණික හා වෘත්තීය පුහුණු පාඨමාලාවල වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය

මේ පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කොට කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන මගින් පවත්වනු ලබන පාඨමාලා හා ඒ සඳහා ප්‍රවේශවීමට හැකි අවස්ථාවන් පිළිබඳව හඳුනා ගැනීම සිදු කරන ලදී. එමෙන්ම, තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතන වල නෛතික ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා සම්පත්දායකයින් සමඟ සිදු කරන ලද මූලික සාකච්ඡාවක් 2016 වර්ෂයේ දෙවන කාර්තුවේ මැද භාගයේදී සිදු කරන ලදී.

එහිදී හඳුනාගත් කරුණු මත දත්ත රැස්කිරීමේ උපකරණ 2016 මැයි මස සකස් කර අවසන් කර සංශෝධනය කරමින් පවතී.

අධ්‍යයනය ක්‍රියාත්මක කිරීමේ දී තොරතුරුවල විශ්වාසනීයත්වය හා ප්‍රතිපත්ති සම්පාදනයේ දී අධ්‍යයනයේ වලංගුතාවය ආරක්ෂා වන අයුරින් එහි සත්‍ය තත්ත්වය විමසා බැලීමට දිවයිනේ දිස්ත්‍රික්ක 18ක් ආවරණය වන පරිදි කාර්මික පාඨමාලා පවත්වන ආයතන වෙත ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිලධාරීන් සෘජුවම ගොස් තොරතුරු එක්රැස් කරන ලදී. ඒ යටතේ වෘත්තීය පුහුණුව සපයන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, විශ්වවිද්‍යාල විද්‍යායතන හා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය යන ආයතන නියෝජනය වන පරිදි තෝරාගත් ආයතන 18ක් වෙත කොමිෂන් සභාවේ නිලධාරීන් සෘජුවම ගොස් තොරතුරු එක්රැස් කරන ලදී.

තව ද, කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන 16කින් තැපැල් මාර්ගිකව දත්ත ගෙන්වා ගැනීම 2016 වර්ෂය අවසානය වනවිට සිදු කරන ලදී. එසේ රැස් කර ගන්නා ලද දත්තයන්හි සිංහල මාධ්‍ය දත්ත පරිගණක ගත කර විශ්ලේෂණය කිරීම 2016 වර්ෂය අවසාන වනවිට සිදු කෙරිණි.

## 4. ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත සම්පාදනය කෙරුනු වාර්තා.

ඉහත සඳහන් කාර්යයන් වලට අමතරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් " සිංහල අක්ෂර ලේඛණය හා භාෂා ප්‍රයෝග විධි ප්‍රමිතිය" මැයෙන් වූ ග්‍රන්ථයක් වාග් විද්‍යාව පිළිබඳ මහාචාර්යවරුන් විසින් සකස් කරන ලදුව සංස්කරණය කරන ලදී.

## 5. පළාත් අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව

උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2014 සමාලෝචන වාර්තාව මත පදනම්ව අනෙකුත් පළාත්වලද අධ්‍යාපන පද්ධතිය පිළිබඳව පුළුල් සමාලෝචනයක් සිදු කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සහ මුදල් කොමිසමේ මූල්‍යමය දායකත්වයෙන් සහ ඒ ඒ පළාත්වල පළාත් අධ්‍යාපන අමාත්‍යවරුන්, ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය යන ආයතනවල නිළධාරීන් ද ඇතුළු විද්වතුන් රැසකගේ සහභාගිත්වයෙන් 2016 ඔක්තෝබර් මස පැවැත්විණි.

2016.12.31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදිවේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | _ |
| ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 3 | 1 | 2 |
| නියෝජ්‍ය ලේකම් / සහකාර ලේකම් | 1 | 1 | _ |
| ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 4 | 4 | _ |
| පරිපාලන නිලධාරී | 1 | _ | 1 |
| වැඩසටහන් නිලධාරී (මුදල්) | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 4 | 2 | 2 |
| වැඩසටහන් නිලධාරී (තොරතුරු) | 1 | _ | 1 |
| කළමනාකරණ සහකාර | 10 | 7 | 3 |
| රියදුරු | 6 | 6 | _ |
| ආරක්ෂක නියාමක | 2 | 2 | _ |
| කාර්යාල සහයක | 4 | 4 | _ |
| **මුළු** | **38** | **29** | **9** |

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | |
|---|---|---|
| අතිරේක ලේකම් | 2 | බඳවාගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබාගත යුතුය. |
| ගණකාධිකාරී | 1 | |
| සංවර්ධන නිලධාරීන් | 4 | |
| **එකතුව** | **7** | |

**මානව සම්පත් සංවර්ධනය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මේවන විට 29 ක් වන අතර අනුමත කාර්ය මණ්ඩලය 38කි. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණය අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණතා සහිත කාර්ය මණ්ඩලයක් සිටීම ඉතා වැදගත් වේ. ඒ අනුව, නව තනතුරු ඇති කිරීමට ද පවත්නා සීමිත පුරප්පාඩු පිරවීමට ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිය.

තවද, මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍යතා හඳුනාගෙන ප්‍රශස්ත මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම තුළින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලය ධාරිතා සංවර්ධන/පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම අවශ්‍ය වේ.

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය / පුහුණුව පිළිබඳ තොරතුරු - 2016**

| | වැඩසටහනෙහි නම / ආයතනය | සහභාගී වූ නිලධාරීන්ගේ නම | තනතුර | කාලය |
|---|---|---|---|---|
| 1. | Effective Handling of Personal Files at NILS | එස්.එම්.ඒ. ද අල්විස් මහතා | නියෝජ්‍ය ලේකම් | දින 01 (2016.10.24) |
| 2. | Annual Stock Verification and Disposal of Unserviceable Items at Prag Institute | එස්.එම්.ඒ. ද අල්විස් මහතා<br>ඩබ්.ඒ.ආර්.එන්. කුමාරසිංහ මිය<br>ඊ.එම්.වයි. සචිත් මහතා<br>ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය<br>ජී.එල්. නිමේෂා මිය | නියෝජ්‍ය ලේකම්<br>වැඩසටහන් නිලධාරී (මුදල්)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර | දින 01 (2016.12.20) |
| 3. | Master of Education at Open University of Sri Lanka | එන්.පී.ජේ. හේවගේ මහතා | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | අවු. 01<br>(2015/1-2016/1) |
| 4. | Advanced Tamil Course at Department of Official Languages | ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය<br>ජී.එල්. නිමේෂා මිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර | මාස 06<br>(2016/1-2016/6) |
| 5. | Procument and Evaluation for IT Related Equipment at SDFL | එන්.පී.ජේ. හේවගේ මහතා<br>ඊ.ජී.අයි. ගමගේ මෙනවිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>කළමනාකරණ සහකාර | දින 02 (2016.08.30,31) |
| 6. | Procument at NILS | එන්.පී.ජේ. හේවගේ මහතා<br>වයි.ආර්. හේවාසිලියනගේ මිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>කළමනාකරණ සහකාර | දින 02 (2016.10.19,20) |
| 7. | Communication for Emerging Leader at SDFL | ආර්.ඒ. කරුණාරත්න මහතා<br>ඊ.එම්.වයි. සචිත් මහතා | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | දින 01 (2016.10.27) |
| 8. | Training Program on Assets Management at NILS | ඊ.එම්.වයි. සචිත් මහතා<br>ජී.එල්. නිමේෂා මිය<br>ඇලෙක්ස් ෆිගරාඩෝ මහතා<br>එස්.එම්.එන්.එස්. සේනාධිපති මිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 02 (2016.05.30,31) |
| 9. | E-Government and Security at SLIDA | ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | දින 02 (2016.10.20, 21) |
| 10. | Procument Procedure and Usage at NILS | ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය<br>ඊ.ජී.අයි. ගමගේ මෙනවිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර | දින 03 (2016.06.14,21,28) |

| | | | | |
|---|---|---|---|---|
| 11. | Postgraduate Diploma in Education at University of Colombo | ඩබ්.ඩී.ජේ.කේ. දමයන්ති මිය<br>ඊ.එම්.වයි. සචිත් මහතා | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | අවු.01 මාස 06<br>(2015 සිට) |
| 12. | Administration of Machines and Vehicles at NILS | වයි.ආර්. හේවාසිලියනගේ මිය | කළමනාකරණ සහකාර | දින 02 (2016.11.22,23) |
| 13. | Office Management and Office Procedures at SDFL | එම්.ජේ.ඩී. ධනංජනී මිය<br>ඇලෙක්ස් හිගරාඩෝ මහතා | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 02 (2016.08.11,12) |
| 14. | Basic Tamil Course at Department of Official Languages | එම්.ජේ.ඩී. ධනංජනී මිය<br>ඩී.ජී.අයි.පී. සෙනවිරත්න මහතා<br>එස්.එම්.එන්.එස්. සේනාධිපති මිය<br>කේ.අයි.ආර්.කේ. පෙරේරා මහතා | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර<br>රියදුරු | මාස 06 (2016/6 -2016/12) |
| 15. | Role of Accounting at NILS | එම්.ජේ.ඩී. ධනංජනී මිය<br>ජී.එල්. නිමේෂා මිය | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 01 (2016.11.11) |
| 16. | Scheme of Recruitment at NILS | එම්.ජේ.ඩී. ධනංජනී මිය<br>ජී.එල්. නිමේෂා මිය | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 02 (2016.11.24,25) |
| 17. | Advanced Sinhala Course at Department of Official Languages | ඇලෙක්ස් හිගරාඩෝ මහතා | කළමනාකරණ සහකාර | මාස 06 (2016/1 -2016/6) |
| 18. | Scientific Safety Driving at CERTRAC | එස්.ජේ.සී. ප්‍රියන්ජිත් මහතා | රියදුරු | දින 01 (2016.09.06) |
| | | කේ.ඩී.එන්. පෙරේරා මහතා<br>කේ.අයි.ආර්.කේ. පෙරේරා මහතා | රියදුරු<br>රියදුරු | දින 01 (2016.03.01) |
| 19. | Tasks of Office Assistants for High Labour Productivity at NILS | ඒ.වී.එස්.වී. පිගේරා මහතා | කාර්යාල කාර්ය සහයක | දින 01 (2016.03.18) |
| 20. | Training Program for NEC Staff at NILS | ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී - 2<br>නියෝජ්‍ය ලේකම්- 1<br>ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී - 2<br>වැඩසටහන් නිලධාරී (මුදල්)– 1<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)– 2<br>කළමනාකරණ සහකාර – 7<br>රියදුරු – 6<br>ආරක්ෂක නියාමක – 2<br>කාර්යාල කාර්ය සහයක - 3 | | දින 01<br>(2016.12.22 හෝ 2016.12.23) |

## අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2016.12.31 දිනට

| වැය විෂය අංකය | කාර්යය | වෙන්කළ මුදල (රු.) | වැය කළ මුදල (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | **36,500,000** | **31,461,796** | 86 |
| | **වැටුප** | **22,750,000** | **19,224,971** | 85 |
| 1001 | වැටුප් හා වේතන | 12,000,000 | 11,502,084 | 96 |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | 750,000 | 545,145 | 73 |
| 1003 | වෙනත් දීමනා | 10,000,000 | 7,177,742 | 72 |
| | **ගමන් වියදම්** | **300,000** | **49,350** | 16 |
| 1101 | දේශීය | 100,000 | 49,350 | 49 |
| 1102 | විදේශීය | 200,000 | _ | |
| | **සැපයීම්** | **2,050,000** | **1,610,206** | 79 |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 300,000 | 253,812 | 85 |
| 1202 | ඉන්ධන හා ළිහිසි තෙල් | 1,500,000 | 1,172,127 | 78 |
| 1203 | නිල ඇඳුම් | 150,000 | 92,279 | 62 |
| 1205 | වෙනත් දීමනා | 100,000 | 91,989 | 92 |
| | **නඩත්තු වියදම්** | **2,410,000** | **1,841,904** | 76 |
| 1301 | වාහන | 1,500,000 | 1,231,501 | 82 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 800,000 | 502,403 | 63 |
| 1303 | ගොඩනැගිලි | 110,000 | 108,000 | 98 |
| | **ගිවිසුම්ගත සේවා** | **8,636,927** | **8,382,292** | 97 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,100,000 | 1,081,009 | 98 |
| 1403 | විදුලිය හා ජලය | 890,000 | 785,963 | 88 |
| 1404 | බදු කුලිය | 4,800,000 | 4,800,000 | 100 |
| 1405 | වෙනත් | 1,846,927 | 1,715,320 | 93 |
| | **මාරුකිරීම්** | **353,073** | **353,073** | 100 |
| 1502 | විශ්‍රාම පාරිතෝෂික | 353,073 | 353,073 | 100 |
| | **මූලධන වියදම්** | **4,650,000** | **2,185,077** | 47 |
| | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **50,000** | _ | |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 50,000 | _ | |
| | **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | **600,000** | **462,150** | 77 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | 437,818 | 88 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000 | 24,332 | 24 |
| | **ධාරිතා සංවර්ධනය** | **1,000,000** | **280,100** | 28 |
| 2401 | පුහුණුව හා සංවර්ධනය | 1,000,000 | 280,100 | 28 |
| | **වෙනත් මූලධන වියදම්** | **3,000,000** | **1,442,827** | 48 |
| 2502 | අධ්‍යාපන අංශය සඳහා ප්‍රතිපත්ති යෝජනා | 3,000,000 | 1,442,827 | 48 |
| | **එකතුව** | **41,150,000** | **33,646,874** | 82 |

ඇමුණුම I

**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2016**

| විස්තරය | ප්‍රමාණය | මිල (රු.) |
|---|---|---|
| ප්‍රවේශ ශාලා පුටු | 15 | 116,437.50 |
| පැති ඒකක සහිත විධායක මේස | 1 | 50,320.00 |
| ලිපිගොනු කැබිනට් - වානේ | 2 | 36,696.50 |
| කුඩා වේදිකාව | 1 | 33,292.50 |
| කාර්යාලීය මේස | 3 | 32,775.00 |
| විධායක පුටු (හයි බැක්) | 2 | 29,601.00 |
| අමුත්තන්ගේ පුටු | 2 | 21,482.00 |
| ෆැක්ස් යන්ත්‍ර | 1 | 20,125.00 |
| වානේ අල්මාරි | 1 | 20,102.00 |
| රාක්ක සහිත කබර්ඩ් | 1 | 19,837.50 |
| විධායක පුටු (ලෝ බැක්) | 2 | 17,917.00 |
| අමුත්තන්ගේ පුටු-5006 | 2 | 16,767.00 |
| ජංගම පරිගනක බැටරි | 1 | 7,900.00 |
| යූ.පී.එස්. බැටරි | 3 | 7,159.50 |
| ඩේටා ට්‍රැවලර් | 4 | 6,385.00 |
| කෝපි මේසය | 1 | 5,985.00 |
| සිලින්ඩරය සමඟ ගෑස් කුකරය | 1 | 4,905.00 |
| එක්ස්ටෙන්ෂන් කෝඩ් | 3 | 4,850.00 |
| යූ.පී.එස්. | 1 | 4,206.90 |
| කම්පියුටර් මවුස් | 3 | 1,945.00 |
| බිත්ති ඔරලෝසු | 2 | 1,500.00 |
| ඉයර් ෆෝන් | 1 | 1,000.00 |
| ඉලෙක්ට්‍රික් බෙල් | 1 | 960.00 |
| එකතුව | | **462,149.40** |

ඇමුණුම II

## විසර්ජන ගිණුම - 2016

ඩී.ජී.එස්.ඒ

# විසර්ජන ගිණුම 2016

වියදම් ශීර්ෂ අංකය: 12

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | 36,500,000 | | 463,073<br>-463,073 | 36,500,000 | 31,461,796 | 5,038,204 | 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | **36,500,000** | -- | -- | **36,500,000** | **31,461,796** | **5,038,204** | |
| | මූලධන | 4,650,000 | | | 4,650,000 | 2,185,077 | 2,464,923 | 4 |
| | උප එකතුව (මූලධන) | **4,650,000** | -- | -- | **4,650,000** | **2,185,077** | **2,464,923** | |
| | මුළු එකතුව | **41,150,000** | -- | -- | **41,150,000** | **33,646,873** | **7,503,127** | |

පිටු අංක 2 සිට 15 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක16 සිට 19 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 30 - 03 - 2017

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 30/03/17

එච්. නිලක්ෂි එන්. ගුණසේකර
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අංක. 126, නාවල පාර
නුගේගොඩ.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 17 . 03 . 30

එස්. එම්. ආරියරත්න ද අල්විස්
නියෝජ්‍ය ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

**ඇමුණුම III**

## කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු

හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී.

**එහි සාමාජිකත්වය:**

සභාපති : මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා

උප සභාපති : ආචාර්ය ජයන්ති ගුණසේකර මිය 2013.04.29 සිට 2016.03.16 දක්වා

: ආචාර්ය සිවාන්දම් සිවසේගරම් මහතා 2016.06.17 සිට උප සභාපති (ප්‍රතිපත්ති)

: මහාචාර්ය ආරියවංශ දිසානායක මහතා 2016. 11. 02 සිට උප සභාපති (සැලසුම්)

**නිල බලයෙන් පත්වන සාමාජිකයින් :**

| | |
|---|---|
| සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා |
| සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | මහාචාර්ය රජීව විජේසිංහ මහතා |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | ඩබ්ලිව්. එම්. බන්දුසේන මහතා |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා |
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | එච්.ටී. කමල් පද්මසිරි මහතා |

**පත් කරන ලද සාමාජිකයින් :**

පූජ්‍ය අකුරටියේ නන්ද ස්වාමීන්වහන්සේ

කිංස්ලි ප්‍රනාන්දු මහතා

ආරියරත්න හේවගේ මහතා

පුෂ්පා කළුබෝවිල මිය

මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා

මහාචාර්ය එස්. සන්දරසේගරම් මහතා

ආචාර්ය හිරන්ති විජේමාන්න මිය

මහචාර්ය දයන්ත විජේසේකර මහතා

**ලේකම් :**

එච්.එන්.එන්. ගුණසේකර මිය

ඇමුණුම IV

**විගණකාධිපති වාර්තාව - 2016**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 27 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 41.15 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 33.65 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.50 ක් හෙවත් සියයට 18.23 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

CHECKED

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 36.50 | 31.46 | 5.04 | 13.81 |
| මූලධන | 4.65 | 2.19 | 2.46 | 52.90 |
| එකතුව | **41.15** | **33.65** | **7.50** | **18.23** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 01201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන 1.80 | රු.මිලියන 1.17 | රු.මිලියන 0.90 | රු.මිලියන 1.23 | රු.මිලියන 6.00 | රු.මිලියන 2.16 |

**2.3 අග්‍රිම ගිණුම**

කොමිෂන් සභාව යටතේ වූ අංක 7002/0000/00/0256/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 15,379 ක් විය.

**2.4 තැන්පත් ගිණුම**

කොමිෂන් සභාව යටතේ වූ අංක 6000/0000/00/0001/0100/000 දරන තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.30,000 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි.

CHECKED

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department



එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002 /02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු.250,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 කොමිෂන් සභාවේ හා ස්ථාවර කමිටුවේ රැස්වීම් පැවැත්වීම**

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ රැස්වීම් සහ ස්ථාවර කමිටුවේ රැස්වීම් වාර 12 බැගින් රැස්වීම් වාර 24 ක් පැවැත්විය යුතු වුවද, කොමිෂන් සභාවේ, රැස්වීම් වාර 09 ක් හා ස්ථාවර කමිටුවේ රැස්වීම් වාර 5 ක් පමණක් පවත්වා තිබුණි.

**3.3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම වාර්තා කොමිෂන් සභාව විසින් 2017 ජුනි 27 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

CHECKED

4

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව පුස්තකාල පොත් සහ පාරිභෝගික ද්‍රව්‍ය තොග සම්බන්ධව තොග සමීක්ෂණයක් කර නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා එකතුව රු.2,700,000 ක වියදම් ඇස්තමේන්තු කර තිබූ අතර එහි මූල්‍ය හා භෞතික කාර්යසාධනය පහත පරිදි විය.

| | ක්‍රියාකාරකම | ඇස්තමේන්තු ගත මුදල | වියදම් වූ මුදල | ඉතිරිය ඇස්තමේන්තු ගත මුදලේ ප්‍රතිශතයක් ලෙස | ළඟා නොවූ ඉලක්කගත තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | | |
| (i) | සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 300,000 | 294,900 | 1.7 | 2013 වර්ෂයේ අවසන් කිරීමට යෝජිතව තිබූ සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා ප්‍රකාශය ත්‍රෛයි භාෂාවෙන් මුද්‍රණය කර ජනාධිපතිරවයා වෙත ඉදිරිපත් කිරීම 2014, 2015 සහ 2016 වර්ෂ තුනෙහිම ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත් කර තිබුණද එම කාර්යය 2016 දෙසැම්බර් 31 දක්වා ඉටු කර නොතිබිණි. |

CHECKED

5

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | ඉගෙනුම් සාධන විෂමතා කෙරෙහි බලපාන පළාත් මට්ටමේ සාධක හඳුනාගැනීමේ අධ්‍යයනය | 500,000 | 232,000 | 53.6 | නිර්දේශ සහිත අවසන් වාර්තාව පිළියෙල කර නොතිබුණි. |
| (iii) | 3 වන වර්ගයේ අති දුෂ්කර පාසල් සංවර්ධනය සඳහා අවශ්‍යය උපායමාර්ග හඳුනාගෙන අදාළ නිර්ණායක සකස් කිරීම | 350,000 | 184,450 | 47.3 | නිර්දේශ සහිත අවසන් වාර්තාව පිළියෙල කර නොතිබුණි. |
| (iv) | ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 150,000 | 0 | 100.0 | කමිටු 9 ක් ස්ථාපිත කිරීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වාර්තා 2 ක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය | 500,000 | 20,000 | 96.0 | විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය සම්බන්ධව ත්‍රෛයි භාෂාවෙන් වාර්තා 8 ක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය. | 500,000 | 226,000 | 54.8 | ත්‍රෛයි භාෂාවෙන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශන එළිදක්වා නොතිබුණි. |

CHECKED

| | | | | | |
|---|---|---|---|---|---|
| (vii) | තාක්ෂණික හා වෘත්තීය පුහුණු පාඨමාලාවල වත්මන් ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනය. | 400,000 | 258,400 | 35.4 | නිර්දේශ සහිත අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| | **එකතුව** | **2,700,000** | **1,215,750** | | |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 03 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 04 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 20 | 10 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | **එකතුව** | **45** | **29** | **16** |

CHECKED

